# පශ්චාත් යටත්විජිත ස්ත්‍රී නවකතාවට පෙරවදනක්

**එච්. කේ. සී. කේ. රණවීර**[1]

පශ්චාත් යටත් විජිත යුගය තුළ සිංහල නවකතා ක්ෂේත්‍රයෙහි ලා ලේඛිකාවන්ගේ දායකත්වය පිළිබඳ විචාරාත්මක ඇගයීමක් සිදු කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

මෙරට ආරම්භක සාහිත්‍යය පෝෂණයෙහි ලා සැලකිය යුතු දායකත්වයක් සපයන ලද්දේ ලේඛකයන් විසිනි. එහෙත් පශ්චාත්කාලීනව මෙරට සිදු වූ සාමාජික, දේශපාලනික, හා ආර්ථික විපර්යාස හේතු කොටගෙන සිංහල සාහිත්‍යයට ලේඛිකාවන්ගේ ප්‍රවේශය සිදු විය. විශේෂයෙන් ම මෙරට යටත් විජිතයක් වීමත් සමග ම ඇති වූ දේශපාලනික හා ආර්ථික වෙනස්කම් සමාජ හා සංස්කෘතික විපරිවර්තනයකට මඟ පෑදූ බව පෙනේ. එහි අනිවාර්ය ප්‍රතිඵලයක් ලෙස මෙරට ස්ත්‍රීන් කෙරෙහි එතෙක් සමාජයේ තිබූ පසුගාමී ආකල්ප ක්‍රමයෙන් වෙනස් වෙමින් සමාජ දේශපාලනික ආර්ථික මෙන් ම සංස්කෘතික වශයෙන් ද කිසියම් ස්වාධීන බවක් හා විවිධ ක්ෂේත්‍රයන්හි පුරුෂයාට සාපේක්ෂ වශයෙන් ස්වකීය දායකත්වය ලබා දීමේ අවකාශ ලැබිණි.

වැඩවසම් ලක්ෂණ අනූන වූ කුල ක්‍රමය ලිහිල් වී යාම, සමාන අධ්‍යාපන වරප්‍රසාද ලැබීම සර්වජන ඡන්ද බලය ලැබීම මෙන් ම ස්වාධීන ලෙස ආර්ථිකය ගොඩනගා ගත හැකි වන ලෙස සමාන රැකියා වරප්‍රසාද ලැබීම ආදිය පුරුෂ පක්ෂයට සාපේක්ෂ වශයෙන් මෙරට ස්ත්‍රීන් ලද ජයග්‍රහණයකි.

සිංහල සාහිත්‍යයට දායකත්වය ලබා දීමෙහි ලා මෙරට ලේඛිකාවන්ට අවකාශ සැලසෙන්නේ ද මෙකී පසුබිම තුළිනි. යටත් විජිත යුගයේ ස්ත්‍රීන් ලද මෙකී ධනාත්මක සමාජ ප්‍රවේශය පශ්චාත් යටත් විජිත යුගයෙහි ආරම්භක දශකයෙහි එනම්, 1950 දශකයේ සිංහල නවකතාවට ලැබුණු ස්ත්‍රී දායකත්වය ඇගයීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වෙයි. ඊට අමතර වශයෙන් මෙම අධ්‍යයනයෙහි නිගමන අතර පහත සඳහන් ප්‍රවේශයන් හඳුනා ගැනීම අපේක්ෂා කෙරේ.

---

[1] සිංහල අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ
ඊමේල්: kumudukr@yahoo.com

i. මෙකී නිර්මාණ සමස්තයක් ලෙස ශ්‍රී ලාංකික ස්ත්‍රියගේ යථාර්ථය ප්‍රකාශ කරන්නේ දැයි හඳුනා ගැනීම
ii. 50 දශකයේ (පශ්චාත් යටත් විජිත ස්ත්‍රී නවකතාවේ) කිසියම් දේශපාලන ප්‍රවේශයක් ඇත්දැයි විභාග කිරීම
iii. ලාංකේය නවකතා ලේඛිකාවන්ගේ දර්ශනය අවබෝධ කර ගැනීම
iv. පශ්චාත් යටත්විජිත ස්ත්‍රී නවකතාව සහ යටත්විජිත යුගයේ ස්ත්‍රී නවකතාව සම්බන්ධ තුලනාත්මක අධ්‍යයනයට අවකාශ සලසා ගැනීම

50 දශකයේ ස්ත්‍රී නවකතා අධ්‍යයනය මගින් ලේඛිකාවන් ස්වකීය නිර්මාණ සඳහා උපයෝගී කොට ගත් වස්තු විෂයේ කිසියම් සුවිශේෂත්වයක් තිබේද? ස්වකීය නිර්මාණාත්මක අරමුණු ඉටු කර ගැනීමේ කිසියම් අභියෝග හා අර්බුද ඇති වී නම් ඒ මොනවාද? යන්න මෙන්ම ස්ත්‍රීන්වීම නිසාම ඔවුන් කිසියම් පක්ෂග්‍රාහී ස්වරූපයකින් යුතුව ස්ත්‍රීන් පිළිබඳ තේමාවන් සාකච්ඡා කිරීමට පෙළඹී ද යන කරුණු අවධාරණය කෙරෙමින් 50 දශකයේ නවකතා ලේඛිකාවන්ගේ සමාජ මැදිහත්වීම නැතහොත් ජීවන යථාර්ථය ස්පර්ශ කිරීමෙහිලා ඔවුන් සතු ශක්‍යතාව විමසීම මින් අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛ පදඃ** සිංහල නවකතා, ස්ත්‍රී නවකතා, පශ්චාත් යටත්විජිත යුගය
**Title:** Prefacing the post-colonial women novelists
**Keywords:** Sinhala novel, women’s novel, post - colonialism